# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1979/39 - 2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2016 අංක 02 දරන ඌව පළාතේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2016.07.14 වැනි දින සම්මත කරන ලදුව 2016 ජූලි දහ හතර වැනි දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ සමරසිංහ,
ලේකම්,
ඌව පළාතේ පළාත් සභාව.

2016 අගෝස්තු මස 08 වැනි දින,
බදුල්ල රජවීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**2016 අංක 02 දරන ඌව පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය**

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා සාමාජිකයින්ට දීමනා ගෙවීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වන 2010 අංක 09 දරන ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීම් සංශෝධිත ප්‍රඥප්තියේ 02(අ) හා 02 (ආ) උපවගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති මෙයින් ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

01. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයන්ට වැටුප් හා දීමනා ගෙවීම පිණිස වන 2016 අංක 02 දරන ඌව පළාත් සභා සංශෝධිත ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ප්‍රධාන ප්‍රඥප්තියේ 02 (අ) වැනි උප වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 02 (ආ) වැනි උප වගන්තිය සංශෝධනය කිරීම

02. වර්ෂ 2016.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි

(අ) ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික දීමනාව වශයෙන් රුපියල් තිස්පන්දහසක් (රු.35,000/-) ද,

(ආ) ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික දීමනාව වශයෙන් රුපියල් විසිදහසක් (රු.20,000/-) ද,

වන පරිදි ගෙවිය යුත්තේ ය.

මෙම දීමනා ගෙවීම පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය.

03. මෙම ප්‍රඥප්තිය යටතේ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා ඌව පළාතේ පළාත් සභා අරමුදලට වැය අරමුදලට වැය බරක් වන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

04. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු යි.

08 - 766

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.